# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 12

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MARCH 10, 2011 මාර්තු මාසය (බුද්ධ වර්ෂ 2554 මැදින් මාසය)

http://www.lankaheritage.com/lankaviththi/




**කියනා වදන් ඇසෙනා නෑසෙන ලෙසින**
**තේරුම් කරයි මුහුණේ හසරැළි විසින**
**ආවේ නැතත් හැමතැන සිටින සෙ පෙනිණ**
**සුවඳක් මතක නැතිවුණු හදිසියෙ දැනිණ**

**The words spoken are inaudible whisper**
**Yet the smile gives away the meaning**
**Aura of some one close is felt everywhere**
**A forgotten scent has suddenly come in the air**

♦ *Daya Ananda Ranasinghe*

# මැද පෙරදිග කැළඹීම සහ ශ්‍රීලංකාව

**කීර්ති ජයසුන්දර විසිනි**

**ප**සුගිය සති කීපය මුළුල්ලේ පටන් මැද පෙරදිග පුරා හමායමින් පවතින ප්‍රවේගාත්මක දේශපාලනික කැළඹීම අපි අවධානයෙන් යුතුව බලා සිටිමු. තුනීසියාවෙන් පටන්ගෙන එහි නායක බෙන් අලි බලයෙන් පහකරමින් ඒ ප්‍රචණ්ඩ රැල්ල ඊළඟට ගියේ ඊජිප්තුවටයි. එහි ජනාධිපති මුබාරක්ට ද බලය අතහැර ඉවත්ව යන්නට සිදුවිය. දැන් සටන ලිබියාවට සේන්දු වී ඇති අතර ලැබෙන පුවත් අනුව ලිබියානු නායක ගඩාෆිගේ පාක්ෂිකයින් රජයට විරෝධය දක්වන පිරිස්වලට වෙඩිතබා එයින් බොහෝ දෙනෙකු ඝාතනය කර ඇති බවත්, එහි තත්වය වඩාත් තියුණු අතට හැරෙමින් පවතින බවත් කියැවේ. මෙම තත්වය කොයි අතට හැරේදැයි කියන්නට මේ මොහොතේ කිසිවෙකුට හැකි කමක් නැත. කෙසේ වුවද එම කලාපයේ පාලන තන්ත්‍රයද, දේශපාලන ආර්ථික හා සාමාජීය තත්වයන්ද මුළු මනින් නොසිතූ විරූ වෙනසකට පත්වනු ඇති අතර එය මුළු මහත් ලෝකයටම බලපාන්නක් වන බව නම් නිසැකය.

### බටහිර රටවල් සහ මාධ්‍යය

සමස්ථ බටහිර මාධ්‍යයම ඉතා කාර්යබහුලව සිටිමින් මෙම මැදපෙරදිග තත්වය චමත්කාරයෙන් යුතුව වාර්තාකරනු, ආවරණය කරනු පෙනේ. විශේෂයෙන් බටහිර මාධ්‍යය මෙහිදී පුන පුනා සඳහන් කරන්නට රසවත් වචන පෙළක් සොයා-ගෙන ඇත. එනම්, මෙය ඒකාධිපතිවාදී පීඩනයන්ට එරෙහිව අරාබි රටවල සාමාන්‍ය ජනතාව **ප්‍රජාතන්ත්‍රය**, **මානව නිදහස**, හා **සාධාරණත්වය** උදෙසා කරන විමුක්ති අරගලයක් යන්නයි.

එසේම මාධ්‍යයේ තවත් කයිවාරුවක් නම් මේ අරාබි රටවල දැන් සිටින තරුණ පෙළ පේස් බුක්, ට්විටර්, විද්‍යුත් පණිවුඩ (Face Book, Twitter, E-mail) මගින් වහ වහා තම සහෝදර ජනතාවද සෙසු ලෝකයාද දැනුවත්කර මෙම ඒක්ධිපතීන්ට එරෙහිව අරාබි ලෝකයම පෙළ ගස්වන්නට සමත්ව ඇති බවයි. මාස ගණනකට ඉහත මේ මාධ්‍යය විසින් මැද පෙරදිග තරුණ පෙළ හඳුන් වන ලද්දේ හිකමවිය නොහැකි දඩබ්බර අනර්ථකාරී ඉස්ලාමීය බලවේගයක් ලෙසිනි. හදිසියේම දැන් ඒ කණ්ඩායම් බටහිර මාධ්‍යයේ ආදරයට පාත්‍රව ඇත.

### සැබෑ තත්වය

එහෙත් සත්‍යයට සමීප බොහෝ කරුණු මතුවන්නට පටන්ගත් විට ඉන් පැහැදිලිවම පෙනෙන්නට වූයේ මෙහි යථාර්ථය මෙම මාධ්‍යකාරයින් මවාපාන චිත්‍රයට වඩා හාත්පසින්ම වෙනස් එකක් බවයි. පළමුව මේ නැග එන බලවේග මේ රටවල දැන් සිටින, විශේෂයෙන් ඇමරිකාව සහ බ්‍රිතාන්‍යයේ උදව් ලබමින් සිටින, ඒකාධිපති පාලකයන්ට දැඩි ලෙස විරුද්ධ බවයි. බෙන් අලිගේ (තුනීසියාව) සහ මුබාරක්ගේ (ඊජිප්තුව) ඇද වැටීම නිසා බටහිර රටවල් සිය ආර්ථික වාසි තහවුරුකරගැන්මටත්, අනතුරුදායක අනාරක්ෂිත තත්වයක පසුවන ඊශ්‍රායෙලය රැකගැන්ම පිණිසත් මෙතෙක් ගොඩනගාගෙන තිබුණු හිතකර තත්වය නොසිතූ අවුලකට හෙළා ඇත. මේ සියල්ල පිටුපසින් සිටිමින් සටන ක්‍රියාත්මක කරණ කණ්ඩායම වන මුස්ලිම් සහෝදරත්වය (Muslim Brotherhood) පලස්තීනයේ සහ වෙස්ට් බැන්ක් පෙදෙස්වල ඊශ්‍රායලයට විරුද්ධව ක්‍රියාකරන හමාස් කන්ඩායමේම කොටසකි. මේ බව හොඳින් දන්නා ඊශ්‍රායලය දැන් ඉන්නේ කිව නොහැකි විශාල භයකිනි. මෙහිදී උපායශීලී දෙපිටකාට්ටු බටහිර, විශේෂයෙන් ඇමරිකාව සහ බ්‍රිතාන්‍යය කළේ මෙතෙක් තමන් උදව්කළ, මුක්කු ගැසූ මිතුරා වන මුබාරක් අත්හැර-දමමින් දමා ඔහුගෙන් ඈත් වෙමින් දැන් ඔහු මහා දුෂ්ටයෙකු ලෙස ලොවට පෙන්වීමයි.

### ගඩාෆිගේ ලිබියාව

වසර කීපයකට පෙර බටහිරට ගඩාෆි දිස්වූයේ අහිතකර, විෂම, මිනීමරු, පුද්ගලයෙකු හැටියටය. තද ඇමරිකානු විරෝධියෙකු වූ ගඩාෆි එකල යුරෝපයේ ත්‍රස්තවාදී කණ්ඩායම් බොහොමයකට සහාය දෙමින් සිටියේය.

1984 අප්‍රියෙල් මස 17 වන දින ලන්ඩනයේ ලිබියානු තානාපති කාර්යාලය ඉදිරිපිට ජනතා උද්ඝෝෂණ රැළියක් පැවති අවස්ථාවේ ඒ තානාපති කාර්යාලය තුළ සිට ලිබියානු ජාතිකයෙකු තැබූ වෙඩි පහරකින් බ්‍රිතාන්‍ය පොලිස් කාන්තාවක් මියගියාය. ඒ හේතුවෙන් කෝපවූ බ්‍රිතාන්‍ය රජය ලිබියාව සමග පැවති සියළු තානාපති සබඳකම් අත්හැර දැමුවා ය.

ගඩාෆිගේ නියෝජිතයන් 1986 අප්‍රියෙල් 5 දින ජර්මණියේදී ඩිස්කෝ එකක කළ බෝම්බ පිපිරවීමකින් එහි සිටි ඇමරිකානු සහ ජර්මන් ජාතිකයන් කීප දෙනකු මියගිය නිසා ඊට ඇමරිකාව මහත් සේ කිපුණේය. ඔහුට පාඩමක් ඉගැන්වීමට සිතූ එකල ඇමරිකානු ජනාධිපති රොනල්ඩ් රීගන් ඇමරිකානු ගුවන් හමුදාව යවා ලිබියාවේ ට්‍රිපොලි නගරයේ ගඩාෆිගේ නිවස පිහිටි ක්ෂෙත්‍රයට 1986 අප්‍රියෙල් 15 වන දින බෝම්බ ප්‍රහාරයක් එල්ල කරවීය. ගඩාෆි නොමැරී බේරුණත් ඒ ප්‍රහාරයේ හේතුවෙන් ඔහුගේ හදාගත් දියණිය මිය ගියාය. එන පොට හොඳ නැති බව වටහා ගත් ගඩාෆි එතැන් පටන් වැඩි දැහැලීමක් නොකර කරබාගෙන එහෙත් විමසිල්ලෙන් සිටියේය.

අවුරුදු කීපයකට පසු ගඩාෆිගේ නියෝජිත හමුදා නිලධාරියෙකු ඊජිප්තුවේ බ්‍රිතාන්‍ය තානාපතිවරයා මගින් දන්වා සිටියේ තම නායකයා පොලිස් කාන්තාවගේ මරණය වෙනුවෙන් වරද පිළිගන්නා බවත් ඊට කණගාටුවන බවත් ඒ වෙනුවෙන් ඇයගේ පවුලට වන්දි ගෙවීමක් කරන්නට සූදානම් බවත් ය. ගඩාෆි පවුම් දෙලක්ෂ පණස් දාහක වන්දියක් ගෙවා ඇති බව පසුව හෙළිවිය. මේ නිසා 1999 ජූලි මාසයේදී වසර 15 කට පසු බ්‍රිතාන්‍ය යළිත් ලිබියාව සමග තානාපති සබඳකම් ඇරඹුවාය.

### බ්ලෙයාර් සහ ගඩාෆි

මෙසේ යළිත් කිට්ටුවූ ගඩාෆි තම වාසිය පිණිස යොදා ගැන්මට බ්‍රිතාන්‍ය රජය පසුබට නොවීය. 2004 මාර්තු මාසයේ දී එවකට අගමැතිව සිටි ටෝනි බ්ලෙයාර් ලිබියාවට සංචාරයක් සඳහා ගියේ ය. ඒ වසර හැටකට පසු බ්‍රිතාන්‍ය අගමැතිවරයෙකු ලිබියාවට ගිය ප්‍රථම වතාවය. එහිදී ගඩාෆි හමුව යළිත් මිත්‍රත්වය අළුත් කරගත් බ්ලෙයාර් ලිබියාව සමග ඛනිජ තෙල් සහ යුද ආයුධ ගණු දෙනු සඳහා

4 වන පිටුවට ⟶





විස්තර පිටු අංක 3